**Sinhala Translation**

# අන්තර්ජාතික නීතිය පිළිබඳ තෙවන ලෝක ප්‍රවේශයන්හි ඛණ්ඩාංක (TWAIL Coordinates)


## ලුවිස් එස්ලාවා

**ධනුෂ්කා සෙව්වන්දි මැදවත්ත (අනුවාදක)**


ඡායාරූපයඃ සැන් ජුවාන්හි වීදියක්, පුවෙර්තෝ රීකෝ, 1941. 'FSA-Office of War Information Collection'. කොන්ග්‍රස් පුස්තකාලය, වොශින්ග්ටන් D.C., ඇමරිකා එක්සත් ජනපදය (ඡායාරූපය පිළිබඳ සටහනක්)[1]

TWAIL යන කෙටි යෙදුමෙන් වඩා ප්‍රචලිත වී ඇත්තේ අන්තර්ජාතික නීතිය පිළිබඳ තෙවන ලෝකයේ ප්‍රවේශයන්ය. TWAIL යනු තෙවන ලෝකය ගැන සහ තෙවන ලෝකය සමඟ සිතනා අන්තර්ජාතික නීති විශාරදයින් විසින් ගතික සහ චේතානාන්විතව විවෘත වපසරියකින් යුක්තව පවත්වාගෙන යන විමධ්‍යගත ජාලයකි. TWAIL යන විශ්වය තුල 'තෙවන ලෝකය' යන්නෙන් අදහස් වන්නේ 'නිදහස්' හෝ 'කොමියුනිස්ට්' යන දෙහාවයට ම අයත් නොවූ හා විසිවන සියවසේ මැද භාගයේ දී සමාජ දේශපාලනීය වශයෙන් යටපත් කර තැබූ පුළුල් භූමි ප්‍රදේශයකටයි. වර්තමානයේ දී තෙවන ලෝකය බොහෝවිට හඳුන්වනු ලබන්නේ 'සංවර්ධනය වෙමින් පවතින ලෝකය', 'පශ්චාත් යටත්විජිත ලෝකය' හෝ (ගෝලීය) දකුණ ලෙසයි. වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සහ පාරිසරික වශයෙන් අස්ථාවරව දැඩි විෂමතාවන්ට ලක්ව ඇති අපගේ ගෝලීය ක්‍රමය තුල, උතුර තුල දකුණේ ප්‍රගුනණයකට ද, දකුණ තුල උතුරේ ප්‍රගුනණයකටද අප මුහුණ දෙමින් සිටින අතර, එය තුල පිහිටි මෙම තෙවන ලෝකය යන සමාජ-දේශපාලනීය භූමි ප්‍රදේශය වඩා හොඳින් අර්ථ දැක්විය හැක්කේ ['ලෝකයේ වැඩි කොටස' (most of the world)] ලෙසය.

## TWAIL වසන්තය

ජේම්ස් ගාතිට අනුව, TWAIL ආරම්භ වුයේ අන්තර්ජාතික නීතිය පිළිබඳ තෙවන ලෝක ප්‍රවේශයක් ඇති කිරීම ශක්‍ය ද යන්නත්, එවන් ප්‍රවේශයක තිබිය යුතු ප්‍රධාන උත්සුකයන් කවරේද යන්නත් සාකච්ඡා කිරීම සඳහා 1996 වසන්ත සමයේ හාවඩ් විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධිධාරී සිසුන් පිරිසක් එක්රැස් වීමත් සමඟය. එම මූලික සාකච්ඡා සහ

[1] 1941 ජැක් ඩෙලානෝ විසින් සැන් ජුවාන්, පුවෙර්තෝ රීකෝහි පිහිටි මෙම වීදියේ ඡායාරූපය ගනු ලැබුවේ ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රකට Farm Security Administration (FSA) හි කොටසක් වූ ග්‍රාමීය දරිද්‍රතා ඡායාරූපකරණ වැඩසටහන (1935-44) යටතේය. පුළුල්ව පැතිර තිබූ ග්‍රාමීය දරිද්‍රතාවය මෙම වැඩසටහන මඟින් ලේඛනගත කරන ලදී. කුලී නිවැසියන්ට ණය යෝජනා ක්‍රම හරහා දේපල මිලදී ගැනීම් සිදුකිරීමට පහසුකම් සැලසීම මඟින් ඉඩම් පෞද්ගලීකරණය කිරීම සම්බන්ධයෙන් FSA විසින් අනුගමනය කල ප්‍රතිපත්තිය මඟින් අපේක්ෂා කරනු ලැබුවේ මෙම දරිද්‍රතාවය ආමන්ත්‍රණය කිරීමටයි. FSAහි ඡායාරූපකරන වැඩසටහන සහ කුලී නිවැසියන්ට ණය යෝජනා ක්‍රම ලබාදීම යන අංශ දෙක ම එක්සත් ඇමරිකා ජනපදයේ භූමිප්‍රදේශයේ සහ පුවෙර්තෝ රීකෝහි ක්‍රියාත්මක කරන ලදී. එවකටත් සැමතැන පැතිර තිබූ කොකා-කෝලා සලකුණු සහිත මෙම සාමාන්‍යය වීදියෙන් වසඟයට පත් ඩෙලානොගේ මෙම ඡායාරූපය සාක්ෂි සපයන්නේ, ඇමරිකා එක්සත් ජනපදය සහ පුවෙර්තෝ රීකෝ අතර පැවති, FSAහි පුද්ගලීකරණ ව්‍යාපාරය හරහා තවදුරටත් මුල්බැසගත්, (නව)යටත්විජිතවාදී සබඳතාවය පිළිබඳවයි.

ඉනික්බිතිව ගොඩනැගුනු සංවාදවලට තෙවන ලෝකයේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි සිසුන් සහ විද්වතුන් ද, උතුරෙන් පැමිණුනු ගමිකයන් ද ඇතුලත් විය.

පළමු TWAIL හමුව පැවැත්වුනේ 1997 මාර්තු මාසයේදී හාවඩ් විශ්ව විද්‍යාලයේදීය. එතැන් සිට TWAILකරුවන්ගේ කාර්යභාරයන් වෙන් කර දැක්වූ TWAILහි මූලික අරමුණ වුයේ අන්තර්ජාතික නීතිය සම්බන්ධයෙන් දැනට පවත්නා උපකල්පනයන් වන මධ්‍යස්ථභාවය (neutrality) සහ විශ්වීයත්වය (universality) ගැන, ඓතිහාසිකව පැවතුනු සහ අඛණ්ඩව පැවතෙමින් යන අධිරාජ්‍යවාදය හා අන්තර්ජාතික නීතිය අතර පවත්නා දිගු කාලීන ඇසුර ආශ්‍රය කරගනිමින්, ප්‍රශ්නගත කිරීමයි. TWAILහි තවත් සාමාන්තර අරමුණක් වුයේ ශ්‍රීඝ්‍රයෙන් ගෝලීයකරණය වන ලොවක් සඳහා නව නිර්යටත්විජිතකරණ න්‍යායපත්‍රයන් (new decolonization agendas) හා නව විමුක්තිකාමී න්‍යායපත්‍ර (new emancipatory agendas) විස්තර කිරීමය. පසුව, බී. ඇස්. චිම්නි ඔහුගේ 'TWAIL Manifesto' හි සඳහන් කර ඇති පරිදි වර්තමානයේදී ද තෙවන ලෝකය වෙළී පවතින්නේ 'නැවත යටත්විජිතකරණයට ලක්වීමේ තර්ජනය' පිළිබඳ බියකිනි. මෙම යථාර්ථයට මුහුණ දෙමින්, තෙවන ලෝක ප්‍රජාවගේ 'භෞතික සහ සදාචාරාත්මක උත්සුකයන්' ආමාන්ත්‍රණය කිරීම සඳහා නව මෙවලම් කට්ටලයක් සකස් කළ යුතුව තිබුණි.

TWAILහි ආරම්භක කණ්ඩායම විසින්, අන්තර්ජාතික නීතිය සහ තෙවන ලෝකයේ තත්ත්වයන් අතර ඇති සම්බන්ධය ප්‍රශ්න කිරීම සඳහා වූ ඔවුන්ගේ කැපවීමේදී, පැහැදිලිව හඳුනාගෙන තිබු දෙයක් වුයේ අන්තර්ජාතික නීති ක්‍රමය තුල පවත්නා විචලනයන් සහ සංකූලතා සමඟ දිගු කලක් තිස්සේ ගැටෙමින් සිටි හොඳින් ස්ථාපිත අන්තර්ජාතික නීතීඥයින්, දේශපාලන ක්‍රියාකාරීන්, සහ දකුණේ බුද්ධිමතුන් පරපුරට ගෞරව කිරීමේ වැදගත්කමයි. 'විධිමත්' අධිරාජ්‍යවාදය අවසන් කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලද අයවලුන් පිළිබඳව TWAILකරුවන් විශේෂයෙන් ම අවධානය යොමුකරන ලදී.

TWAIL I සහ TWAIL II යන පද ඇන්තනී ඇන්ගි සහ චිම්නි විසින් නිර්මාණය කරන ලද්දේ දකුණු නැඹුරුවක් සහිතව දිගු කාලීනව පැවත තිබු අන්තර්ජාතික නීති සම්ප්‍රදාය සම්බන්ධයෙන් වටහාගැනීමක් ඇති කරගැනීම සඳහාය. පළමු පරම්පරාවේ පශ්චාත් යටත්විජිතවාදය පිළිබඳව ජාත්‍යන්තර නීති ක්‍රියාකාරීන් විසින් රචිත ශාස්ත්‍රීය කෘති/ලිපි TWAIL I යන්නෙන් හැඳින්වුණු අතර, TWAIL II යන්නෙන් හැඳින්වූයේ TWAIL I සම්ප්‍රදාය පුළුල් ලෙස අනුගමනය කරමින්, එය විවරණය කරමින් හා අවිකල්පයෙන් ම එයින් සැලකියයුතු අයුරින් බැහැරවෙමින් ද නිර්මාණය කරන ලද ශාස්ත්‍රීය කෘතීන් හා ලිපිය.

මෙම අතීතානුයෝගී කාලක්‍රමය සටහන් කිරීම මඟින් ඇන්ගි සහ චිම්නි විසින් අවධාරණය කරන ලද්දේ TWAIL සඳහා මූලික වන අන්තර්පාරම්පරික පුහුණුව සහ අධ්‍යාපනයයි. ඒ සමඟ ම ඔවුන් විසින් කරන ලද්දේ TWAIL II විශාරදයන් විසින් දකුණේ තත්ත්වයන් ප්‍රශ්නගත කිරීම සඳහා ගෝලීය සහ අන්තර්ඡේදනීය පැතිකඩයන් (intersectional perspective) භාවිතා කරමින් සිදුකරන ලද පුරෝගාමී කර්තව්‍යයන්

මතුකර දැක්වීමයි. TWAIL I හි කාර්යභාරය වූයේ තම රටවල පැවති විධිමත් යටත්විජිතවාදයට එරෙහිව නැගී සිටීමයි. අපගේ අරගලය - TWAILකරුවන් II, III, IV සහ ඉන් ඔබ්බට නැගී සිටින TWAILකරුවන්ගේ අරගලය - වන්නේ 'විධිමත්' අධිරාජ්‍යයේ අවශේෂ කොටස් සමඟ කටයුතු කිරීම සහ 'අවිධිමත්' අධිරාජ්‍යවාදයේ බහුමාන පැතිකඩයන් කවරේද යන්න පිළිබඳව විකාශනීය ලෙස අවධානය යොමු කිරීමයි.[2]

## TWAILහි ලෝකය

මෙම ප්‍රථම සංවාද වලට පසු වර්ෂ වල, TWAIL සාමාජිකයන් විසින් කරන ලද පර්යේශන වල භූගෝලීය සහ ඓතිහාසික විශයපථයන් ද TWAILශාස්ත්‍රීය කෘතීන් හා ලිපිවල තේමාවන් ද විශාල ලෙස වර්ධනය වීමකට ලක්ව ඇත.

අන්තර්ජාතික නීතියේ පොදු න්‍යායන් සංශෝධනය කිරීම සහ එහි ගෝලීය ඉතිහාසය නිරාවරණය කිරීම; අන්තර්ජාතික පාලන ක්‍රමයේ  කාර්යය සහ එතුල අන්තර්ජාතික නීතිඥයන් රඟ දක්වන භූමිකාව ප්‍රශ්නගත කිරීම; රාජ්‍යය යන්න පිළිබඳව නැවත න්‍යාය ගොඩනැගීම සහ ව්‍යවස්ථා ක්‍රමයන්, ආරක්ෂාව, සංක්‍රාන්ති යුක්තිය පිලිබඳ දැනට පවත්නා සංවාදයන් ප්‍රතිශෝධනය කිරීම; අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය, අන්තර්ජාතික ආර්ථික නීතිය, අන්තර්ජාතික පරිසර නීතිය, අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික අපරාධ නීතිය පිළිබඳව දැනට පවත්නා සංවාද පිළිබඳව හරස් ප්‍රශ්න ඇසීම; සමාජ ව්‍යාපාරයන්හි වැදගත්කම ඉස්මතුකිරීම, අන්තර්ජාතික ක්‍රමය තුල ස්වදේශික ජනතාව හා සංක්‍රමණිකයන් දැක්වෙන්නේ කෙසේද යන්න වැනි මාතෘකා ඇතුළු වෙනත් මාතෘකා මෑත කාලීනව TWAIL විද්වතුන්ගේ අවධානය යොමුවූ මාතෘකා අතර වේ.[3] මෙම විද්වත් මැධිහත්වීම් සියල්ලේ ම දක්නට ලැබෙන්නේ වර්ගය,

---

[2] නිර්යටත්විජිතකරණ කාලයට පෙර, ඒ අතරතුර, සහ ඉන් පසුව පැවති 'අවිධිමත්' අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් වැඩිදුර කියවීම සඳහා විශේෂයෙන් ම, John Gallagher and Ronald Robinson, 'The Imperialism of Free Trade', (1953) 6(1) The Economic History Review 1; W.M. Roger Louis and Ronald Robinson, 'The Imperialism of Decolonization', (1994) 22(3) The Journal of Imperial and Commonwealth History 462 බලන්න.

[3] ආභාවනය කල හැකි ප්‍රකාශනයන් බොහෝ වේ - මෙහි දක්වා ඇත්තේ උදාහරණ කිහිපයක් පමණි.අන්තර්ජාතික නීතියේ සාකල්‍ය න්‍යායන් සහ අන්තර්ජාතික නීතියේ ඉතිහාසය සහ අන්තර්ජාතික පාලන ක්‍රමය TWAIL දෘෂ්ටිකෝණයෙන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් Anthony Anghie, Imperialism, Sovereignty and the Making of International Law (CUP, 2004); B.S. Chimni, International Law and World Order (CUP, 2nd ed, 2017); Sundhya Pahuja, Decolonising International Law: Development, Economic Growth and the Politics of Universality (CUP, 2011); Luis Eslava, Local Space, Global Life: The Everyday Operation of International Law and Development (CUP, 2015) බලන්න. අන්තර්ජාතික නීතිය පිලිබඳ නීතිඥයන්ගේ සහ විශාරදයන්ගේ භූමිකාවන් සම්බන්ධයෙන් Liliana Obregón, 'Between Civilisation and Barbarism: Creole Interventions in International Law' (2006) 27(5) Third World Quarterly 815; Luis Eslava and Sundhya Pahuja, 'Between Resistance and Reform: TWAIL and the Universality of International Law' (2011) 3 Trade Law and Development 103; Arnulf Becker Lorca, Mestizo International Law: A Global Intellectual History 1842–1933 (CUP, 2015); Adil Hasan Khan, 'International Lawyers in the Aftermath of Disasters: Inheriting from Radhabinod Pal and Upendra Baxi' (2016) 37(11) Third World Quarterly 2061 බලන්න. රාජ්‍යය යන්න පිළිබඳව නැවත න්‍යායයන් ගොඩනැගීම සම්බන්ධයෙන් Rose Parfitt, The Process of International Legal Reproduction: Inequality, Historiography, Resistance (CUP, 2019) බලන්න. TWAIL පැතිකඩකින් ව්‍යවස්ථා නීතිය ගැන ලියැවුණු Zoran Oklopcic, 'The South of Western Constitutionalism: A Map Ahead of a Journey' (2016) 37(11) Third World Quarterly 2080 බලන්න. සංක්‍රාන්ති යුක්තිය සහ ආරක්ෂණය සම්බන්ධයෙන් වන කථිකාවත සඳහා James T. Gathii, 'The Use of Force, Freedom of Commerce, and Double Standards in Prosecuting Pirates in Kenya' (2010) 59 American University Law Review 1321; Vasuki Nesiah, 'Theorizing Transitional Justice' in Anne Orford and Florian Hoffman (eds.), Oxford Handbook of International Legal Theory (OUP, 2016); John Reynolds, Empire, Emergency and International Law (CUP, 2017); Ntina Tzouvala, 'TWAIL and the "Unwilling or Unable" Doctrine: Continuities and Ruptures' (2015) 109 AJIL Unbound 266 බලන්න. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පිලිබඳ නීතිය සම්බන්ධයෙන් M. Mutua, 'Savages, Victims,

ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය, පන්ති විෂමතා යන කාරණාවන්හි සමගාමී ක්‍රියාකාරීත්වයට සහ යටත්විජිතකරණ-නිවාරණයේ අතීත සහ වත්මන් ස්වරූප අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් TWAIL මඟින් දක්වා ඇති අවධානයයි.[4] 1997 පැවති ප්‍රථම TWAIL හමුව නිසා අන්තර්ජාතික සම්මන්ත්‍රණ මාලාවක් උපත ලබන ලදී. මෙමඟින් පර්යේෂණ ප්‍රතිඵලයන් හුවමාරු කරගැනීමටත්, පැරණි මිත්‍රත්ව තීව්‍ර කරගැනීමට සහ නව මිත්‍රත්ව ගොඩනගා ගැනීමටත්, අන්තර්ජාතික නීතියේ ශික්ෂණ ශාත්‍රය සහ පරිචය (pedagogy and practice) ප්‍රතිසංස්කරණය කිරීමේ භව්‍යත්වය සලකා බැලීමටත් අවස්ථාවන් සැලසී ඇත. ඔස්ගුඩ් හෝල් නීති විද්‍යාලයේ දී ද (2001), ඕල්බනී නීති විද්‍යාලයේ දී ද (2007), බ්‍රිටිෂ් කොලොම්බියා විශ්ව විද්‍යාලයේ දී ද (2008), යුනිවර්සිතේ පරී 1 පන්තේඔං-සෝර්බෝන් හී දී ද (2010), ඔරගන් නීති විද්‍යාලයේ දී ද (2011), කයිරෝහි ඇමරිකානු විශ්ව විද්‍යාලයේ දී ද (2015), කොළඹ විශ්ව විද්‍යාලයේ දී ද (2017), සහ ඉතා මෑතකදී සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයේ දී ද (2018) මෙම සම්මන්ත්‍රණ පවත්වා ඇත.

ප්‍රථම TWAIL හමුවෙන් 20+ වසරක් ගතවූ පසු ද, අන්තර්ජාතික නීති ක්‍රමයේ අතීතය සහ වර්තමානය ගැන වත්මනේදී පවත්වන විවාදයන්හි TWAIL ප්‍රධාන තැනක් ගනී. අන්තර්ජාතික නීතිය ස්වභාවයෙන්ම ප්‍රගතිශීලී බව සහ එය සැමවිටම සමාජයීය, ආර්ථික, සහ පාරිසරික යුක්තිය සම්බන්ධයෙන් කටයුතු කරන බවට මුල්බැසගෙන තිබූ හේතු විද්‍යාත්මක සංකල්පවාදී අදහස් (teleological conceptualisations of international law) TWAIL හි අන්තර්ඥානය සහ TWAIL පතාකය යටතේ උපදවන ලද කෘතීන් හේතුවෙන් වෙනස් වී ඇති බව පැවසීම, සත්‍යය වශයෙන් ම ගත්කල, TWAIL පිලිබඳ අධිතක්සේරුවක් නොවනු ඇත. මෙහි ඇති වඩාත් ම වැදගත් කරුණ වන්නේ, TWAIL කරුවන්ගේ කාර්යයන් නිසා, අන්තර්ජාතික නීතිය පිළිබඳව පවත්නා

and Saviors: The Metaphor of Human Rights' (2001) 42(1) Harvard International Law Journal 201 බලන්න. අන්තර්ජාතික ආර්ථික නීතිය සම්බන්ධයෙන් James T. Gathii and Ibironke Odumosu, 'International Economic Law in the Third World' (2009) 11 International Community Law Review 349; Michael Fakhri, Sugar and the Making of International Trade Law (CUP, 2014) බලන්න. අන්තර්ජාතික පාරිසරික නීතිය සම්බන්ධයෙන්, Usha Natarajan and Kishan Khoday 'Locating Nature: Making and Unmaking International Law' (2014) 27 Leiden Journal of International Law 573; Julia Dehm, 'Post Paris Reflections: Fossil Fuels, Human Rights and the Need to Excavate New Ideas for Climate Justice' (2017) 8(2) Journal of Human Rights and the Environment 280–300; Karin Mickelson, 'International Law as a War against Nature? Reflections on the Ambivalence of International Environmental Law' in Barbara Stark (ed.), International Law and Its Discontents: Confronting Crises (CUP, 2015) බලන්න. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සම්බන්ධයෙන්, Corri Zoli, 'Islamic Contributions to International Humanitarian Law: Recalibrating TWAIL Approaches for Existing Contributions and Legacies' (2015) 109 AJIL Unbound 271 බලන්න. අන්තර්ජාතික අපරාධ නීතිය සම්බන්ධයෙන් Asad G. Kiyani, 'Third World Approaches to International Criminal Law' (2015) 109 AJIL Unbound 255 බලන්න. සමාජයීය ව්‍යාපාර, ස්වදේශීය ජනයා සහ සංක්‍රමණිකයන් සම්බන්ධයෙන් Balakrishnan Rajagopal, International Law from Below: Development, Social Movements and Third World Resistance (CUP, 2003); Amar Bhatia, 'The South of the North: Building on Critical Approaches to International Law with Lessons from the Fourth World' (2012) 14 Oregon Review of International Law 131; Adrian A. Smith, 'Migration, Development and Security within Racialised Global Capitalism: Refusing the Balance Game' (2016) 37(11) Third World Quarterly 2119 බලන්න.

[4] ගෝලීය අන්තර්ඡේදනය, අධිරාජ්‍යවාදය, සහ නිර්යටත්විජිතකරණය පිළිබඳව TWAILහි මුල් කාලයේ ම ඇතිව තිබූ කැපවීම පිළිබඳව කියවීම සඳහා විශේෂයෙන් ම Special Issue Villanova Law Review 45(5) (2000); Antony Anghie, Bhupinder Chimni, Karin Mickelson and Obiora C. Okafor (eds), The Third World and International Order (Brill, 2003) බලන්න. අන්තර්ජාතික ක්‍රමය තුල පවත්නා වාර්ගිකත්වය පිළිබඳව TWAIL වත්මන් කාලයේ දක්වන අවධානය පිළිබඳව නිදසුන් ලෙස Rob Knox, 'Race, Racialisation and Rivalry in the International Legal Order' in Alexander Anievas, Nivi Manchanda, Robbie Shilliam (eds), Race and Racism in International Relations: Confronting the Global Colour Line (Routledge, 2015) බලන්න.

යුරෝ-කේන්ද්‍රීය ආඛ්‍යානයන්ට තවදුරටත් පරීක්ෂාවන්ට ලක්නොවී ක්‍රියාත්මක වීමට ඇති ඉඩ වැළක්වී තිබීමයි.

TWAIL කරුවන්ට, සෙසු ගමිකයන්ට සහ අන්තර්ජාතික නීතිය හදාරන නව පරපුරේ සිසුන්ට ද, අන්තර්ජාතික නීතිය පරිචායකයින්ට (practitioners of international law) ද විශාල සහ වැඩෙමින් පවතින TWAILශාස්ත්‍රය භාවිතා කරගනිමින් කටයුතු කල හැක. දිගු කලක් තිස්සේ අන්තර්ජාතික නීතියට පරිභාහිර නොවී - එයට අනුගාමීව ම පැමිණ ඇති ගෝලීය අසමමිතීන් ප්‍රශ්නගත කිරීම සඳහා ද මෙම TWAIL ශාස්ත්‍රීය කෘතීන් / ලිපි බලමුළු ගැන්විය හැක. අන්තර්ජාතික නීතියේ වෙනත් භාවිතයන් වෙත සහ දකුණ සහ දකුණේ මිතුරන් විසින් මුළු කාල පරිච්ඡේදය පුරාවටම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අරමුණු කරගත් වෙනත් ලෝකයන් වෙත ද ඔවුන්ගේ අවධානය දැන් යොමුකළ හැක්කේ TWAILට ස්තුතිපූර්වකවය.[5]

## අන්තර්ජාතික යුක්ති අධිකරණයේ අන්තර්ජාතික නීතිය පිළිබඳව ඇති තෙවන ලෝක ප්‍රවේශයන්

අන්තර්ජාතික නීතිය කෙරෙහි TWAILවිසින් ඇතිකරමින් පවත්නා වැඩෙන බලපෑම ළඟකදී තහවුරු වූ අවස්ථාවක් වූයේ අන්තර්ජාතික යුක්ති අධිකරණයේ කන්සාදෝ ට්‍රිනිඩෑඩ් විනිසුරුතුමා විසින් චාගොස් උපදේශාත්මක මතයට අදාලව ලියන ලද හින්න මතයෙහි (separate opinion), 'බැන්දුන්ග්, ගෝලීය ඉතිහාසය සහ අන්තර්ජාතික නීතිය' (Bandung, Global History and International Law, CUP 2017) යන සංස්කරණය කරන ලද වෙළුම ගැන කර ඇති සඳහනෙනි. ඉන් පෙර, ඇන්ගී සහ චිම්නි හඳුන්වා දුන් TWAIL Iකරුවන් අතර සිටි තෙවන ලෝකයේ නීතිවේදීන් වන මොහොමඩ් බෙජුයි, ක්‍රිස්ටෝෆ වීරමන්ත්‍රී, සහ ෆුආඩ් අමූන් යන විනිසුරුවරුන්ගේ තීක්ෂණ බුද්ධිය විදහා දැක්වෙන නඩු තීන්දු වල ස්වයං නිර්ණය (self-determination) සහ වත්මන් අන්තර්ජාතික නීති පද්ධතිය තුල මෙම අයිතියට ඇති භූමිය කුමක්ද වැනි මාතෘකා පිළිබඳව විවාද ද දක්නට ලැබුණි.

බැන්දුන්ග් වෙළුම මඟින් බැන්දුන්ග් සම්මන්ත්‍රණයේ 60වන සැමරුම ගැන විවේචනාත්මකව ආවර්ජනය කිරීම සඳහා TWAIL හා බැඳුනු විද්වතුන් හා TWAILහි සමීප සගයන් 40කට අධික පිරිසක් සම්බන්ධ කරන ලදී. අප්‍රිකානු සහ ආසියානු රටවල් 29ක සහභාගීත්වයෙන් 1955දී ඉන්දුනීසියාවේ බැන්දුන්ග් නුවර පැවැත්වූ බැන්දුන්ග් සම්මන්ත්‍රණයෙන් කරන ලද්දේ 'යටත්විජිතවාදය සහ එහි සියලු විද්‍යාමානවීම්' 'අප්‍රමාදීව අවසන් කලයුතු නපුරක්' ලෙස දක්වා හෙලා දැකීමයි. ට්‍රිනිඩෑඩ් විනිසුරුතුමා විසින් බැන්දුන්ග් වෙළුම ආහවනය (cite) කරන ලද්දේ අපගේ මෙම පශ්චාත්-යටත්විජිතවාදී යැයි සැලකෙන ගෝලීය නීති ක්‍රමයට බැන්දුන්ග් සම්මන්ත්‍රණයෙන් අවධාරණය කරන ලද දේ ඇති අඛණ්ඩ අදාලත්වය නියතව ම අවධාරණය කිරීමටයි. ඒකමතිකව ම පාහේ අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් නිශ්චය කරන ලද්දේ චාගොස් දූපත්හි හිටපු යටත්විජිත ස්වාමියා වූ එක්සත් රාජධානිය විසින් 'හැකි තරම් ඉක්මනින්' මෙම දූපත්වල පාලනය මොරීශස් වෙත නැවත භාරදිය යුතු බවයි.

[5] දකුණ පිළිබඳව අදහස් දරන බුද්ධිමතුන් සහ දේශපාලනඥයන් විසින් යෝජනා කරන ලද ගෝලීය දකුණ යන අනෙක් ලෝකය පිළිබඳව කරුණු මතුකිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යයක් දකුණ පිළිබඳව අවධානය යොමුකරන ඉතිහාසඥයන් විසින් ද සිදු කර ඇත. උදාහරණයක් ලෙස මේවා බලන්න Gary Wilder, Freedom Time: Negritude, Decolonization, and the Future of the World (Duke University Press, 2014); Adom Getachew, Worldmaking after Empire: The Rise and Fall of Self-Determination (Princeton University Press, 2019).

අන්තර්ජාතික යුක්ති අධිකරණයට අනුව 1968දී මොරිශස් සම්බන්ධයෙන් සිදු කරන ලද නිර්යටත්විජිතකරණය නීත්‍යානුකූලව පරිපූර්ණව තිබී නොමැත.[6]

චාගොස් උපදේශාත්මක මතය පෙන්වන අයුරින් සහ, බැන්දුන්ග් වෙළුම මගින් අවධාරණය කරන ලෙස බැලූ කල යටත්විජිතවාදය අහවර වී නොමැත. එය දැනටත් සෑම දිනක ම වෙනත් ස්වරූපයන්ට පෙරළෙමින් අන්තර්ජාතික ක්‍රමය තුල දැඩි ලෙස ක්‍රියාත්මක වන දෙයකි. අන්තර්ජාතික නීතියෙහි මධ්‍යගත ආයතනය වන 'ලෝක අධිකරණයේ' සන්ධර්බයට ද TWAIL හි පවත්නා බලපෑම දැඩි ලෙස තහවරු වන්නේ අන්තර්ජාතික නීති අධිකරණයේ මැදිරි තුලට ද TWAIL නැවත ඇතුල් වී ඇති හෙයිනි. එසේ නමුත් TWAILහි අන්තර්ඥානයන් අන්තර්ජාතික නීතියේ උපත සම්බන්ධයෙන් ගෙනහැර පා ඇති කරුණු සහ අප වටා අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවත්නා අධිරාජ්‍යවාදී සැකසුම්වල බලපෑම් දෙස බැලීමේදී පෙනී යන්නේ TWAILහි කාර්යභාරය අධිකරණයට පමණක් සීමා කල නොහැකි බවයි. අධ්‍යයන සහ ක්‍රියාකාරී කටයුතු ද, හැකි සෑම අවස්ථාවකදී ම ගෝලීය නීති හා ආයතනික ක්‍රමයට බාධා කිරීම් ඇතිකිරීමද TWAILහි පරිචයට (TWAIL Praxis) අනිවාර්යයෙන් ම අදාළ වන වෙනත් දේ වේ.

## අන්තර්ජාතික නීතිය පිලිබඳ තෙවන ලෝක ප්‍රවේශයන්හි ඛණ්ඩාංක පහක්

මෙම ලිපියේ TWAIL සම්බන්ධයෙන් දක්වා ඇති සීඝ්‍රගාමී චාරිකාවේ අවසාන කොටසේ දී TWAIL යන හවුල් සිතුවිලි සමූහය සහ පරිචය විදහාපානා 'ඛණ්ඩාංක' පහක් දැක්වීමට මට අවස්ථාව දෙන්න. මම මේ සඳහා 'මූලධර්ම' (principles) යන වදන භාවිතා නොකර 'ඛණ්ඩාංක' (coordinates) යන්න භාවිතා කරන්නේ ස්ථාවර හා කලින් ඇසුරුම් කරන ලද ලක්ෂණ සමූහයකට අනුව හෝ දැඩි සම්මුතියක් හෝ ආයතනික සැකැස්මක් වටා තම විද්වත් මතයන් ගොඩනැගීමට TWAIL කරුවන් අකමැත්තක් දක්වා ඇති බැවිනි. ඒ වෙනුවට TWAIL මගින් උත්සාහ දරා ඇත්තේ නව පරපුරේ විද්වතුන්ට හා ක්‍රියාකාරීන්ට TWAIL විවෘතව තැබීමට සහ, නව සංකල්පාත්මක හා විධිශාස්ත්‍ර / ක්‍රමවේදයන් (conceptual and methodological innovations) නිර්මාණය කිරීමට සහ, විශේෂයෙන් ම, අන්තර්ජාතික ක්‍රමයට අභියෝග කිරීම සඳහා අප භාවිත කරන ක්‍රම නව ආකාරයෙන් ගවේෂණය කිරීම සඳහා සහයෝගීතාවයන් ඇති කිරීමටත්ය.

### 1. අතීතය වැදගත්ය

TWAIL කරුවන් ප්‍රවේශයන්ගෙන් එක්වන අවස්ථාවක් වන්නේ ඔවුන් ඉතිහාසය සහ ඉතිහාසය ලිවීම සහ ලිඛිත ඉතිහාසය ගැන අධ්‍යයනය කිරීම (history and historiography) අගය කිරීමයි.[7] බොහෝවිට TWAIL කෘතීන් වර්තමානයෙන් පියවර කිහිපයක් පිටුපසට ගනිමින් උත්සාහ කරන්නේ අන්තර්ජාතික සම්මතයන් (international norms) සහ ආයතනික පරිචයන් (institutional practices) මතුවූ

[6] චාගොස් උපදේශාත්මක මතය පිළිබඳව TWAIL පැතිකඩකින් ලියවුනු විශ්ලේෂණයක් සඳහා Miriam Bak McKenna, 'Chagos Islands: UN ruling calls time on shameful British colonialism but UK still resisting' (The Conversation, 28 February 2019) බලන්න.

[7] ඉතිහාසය සහ ඉතිහාසය ලිවීම සම්බන්ධයෙන් TWAILහි ඇති බැඳීම සම්බන්ධයෙන් Anne Orford, 'The Past as Law or History? The Relevance of Imperialism for Modern International Law' (IILJ Working Paper, 2012/2) බලන්න. TWAIL ප්‍රකාශනයන් සඳහා ඉතිහාසයේ ඇති වැදගත්කම දක්වන ලියවිල්ලක් සඳහා George Rodrigo Bandeira Galindo, 'Force Field: On History and Theory of International Law' (2012) 20 Journal of the Max Planck Institute for European Legal History 86 බලන්න.

ආකාරය සහ ඒවා වර්ධනය වූ ආකාරය අතීත අවස්ථාවන්ට අදාලව වටහාගැනීමටයි. 'ඇමරිකාව' 'සොයාගැනීම'; ආසියාව සහ අප්‍රිකාව හරහා යුරෝපීය යටත්විජිතවාදය ව්‍යාප්ත වීම; ලෝක යුද්ධ දෙක; 'මැන්ඩේට' සහ 'භාරකාරත්ව' ක්‍රමයන් (mandate and trusteeship systems); නිර්යටත්විජිතකරණ කාලය; 1970 ඇතිවූ තෙල් සහ ණය සම්බන්ධ අර්බුදය; 1980 සහ 1990 යන දෙදශකයන්හි ඇතිවූ නවලිබරල්වාදය; සහ දිගු කාලීනව පැවත ඇති 'ත්‍රස්තවාදයට එදිරි යුද්ධය' (war on terror) ද, යුරෝපීය නොවන යටත්විජිතවාදය ද (චීන අධිරාජ්‍යය සිට ලයිබීරියානු ජනරජය) යනු පශ්චාත් යටත්විජිත රාජ්‍යයන් විසින් පශ්චාත් යටත්විජිත ප්‍රචණ්ඩක්‍රියාවන්හි නියැලුණු ගිණිය නොහැකි අවස්ථා අතරින් අවස්ථාවන් කිහිපයක් පමණි.[8]

විවිධත්වයෙන් යුත් මෙම ඉතිහාසයන්ට අවධානය දැක්වීම මඟින් අන්තර්ජාතික නීතියේ හා යටත්විජිතවාදයේ සම-හටගැන්ම සොයාගැනීමට TWAILකරුවන්ට හැකියාව ලැබී ඇති අතර ම, අන්තර්ජාතික නීති ක්‍රමය විනිවිද ගොස් ඇති විතල බල ගතිකයන් (බල අසමතුලිතතාවයන් / skewed power dynamics) පෙන්වාදීම මඟින් අන්තර්ජාතික නීතියේ පවත්නා අවිවේචනාත්මක රේඛීයභාවය සහ එකමානීයභාවයට (complacent linearity and unidimensionality) අභියෝග කිරීමට ඔවුන්ට හැකියාව ලැබී ඇත. ඒ අතර ම, අන්තර්ජාතික නීතියේ උපකල්පිත ඉතිහාසය ප්‍රශ්නගත කිරීම මඟින් දකුණු දිශානතියක් ඇති විකල්ප අන්තර්ජාතික ප්‍රතිමානක ව්‍යාපෘතීන් සහ ව්‍යාපාරයන් මතුකර දැක්වීමට TWAILකරුවන්ට හැකියාව ලැබී ඇත. ඉහත සඳහන් කර ඇති පරිදි, බැන්දුන්ග් සම්මන්ත්‍රණය, පුද්ගල අයිතිවාසිකම් සහ ජාතීන්ට තම ස්වභාවික වස්තූන් සහ සම්පත් සම්බන්ධයෙන් පවතින ස්ථිර ස්වෛරීභාවය, නොබැඳි ව්‍යාපාරය, නව අන්තර්ජාතික ආර්ථික ක්‍රමය සිට ලා වියා කංපෙසීනා (La Vía Campesina)[9] ව්‍යාපාරය දක්වා දේ මෙයට අයත් වේ.

## 2. අධිරාජ්‍යය ගමන්කරමින් පවතී

TWAILකරුවන්ට සිදුව ඇත්තේ 'ජාත්‍යන්තර ප්‍රජාව' යන්නෙහි දිගු පැවතුම් කාලය වෙත එක් ඇසක් යොමු කරමින් ද, ඒවායේ ව්‍යුහයන් සහ ආයතනයන් නිසා දකුණේ මිනිසුන්ගේ සහ වාතාවරනයන්ට ඇතිවන බලපෑම වෙත අනෙක යොමුකරමින් ද යටත්විජිතවාදය පිළිබඳව ගතික විස්තරයක් ගොඩනැගීමටයි. මාර්ක්ස්වාදී ඉතිහාසකරුවන්ට මෙන් ම, TWAILකරුවන්ට අනුව ද, 'මිනිසුන් තමන්ගේ ම ඉතිහාසය නිර්මාණය කරනු ලබයි, එනමුත් ඔවුන් එසේ කරන්නේ ස්වකැමැත්තට අනුව නොව. ඔවුන් විසින් ම තෝරාගන්නා සිද්ධිමය අවස්ථාවන්ට අනුව ඔවුන් ඉතිහාසය ගොඩනොනගයි, ඔවුන් එය ගොඩ නගන්නේ අතීතයෙන් සම්ප්‍රේෂණය වූ සහ අතීතය විසින් දෙන ලදුව වර්තමානයේදී පවත්නා සිද්ධිමය අවස්ථාවන්ට යටත්වය.'[10]

එසේනම්, TWAILහි දෘෂ්ටිකෝණයෙන් බැලූකල යටත්විජිතවාදය යනු අතීතයේ යම්තැනකට සීමා කර වෙන්කර තැබිය හැකි 'ඓතිහාසික' සංසිද්ධියක් නොවේ. ඒ වෙනුවට, යටත්විජිතවාදය සමන්විතව ඇත්තේ විවිධාකාර වූ අසමතුලිත සැකස්මවල්,

---

[8] යුරෝපීය සහ යුරෝපීය නොවන අධිරාජ්‍යවාදය සහ, රාජ්‍යය යන්න සහබැඳුනු ලොවපුරා දක්නට ලැබෙන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් Rose Parfitt, The Process of International Legal Reproduction: Inequality, Historiography, Resistance (CUP, 2019) බලන්න.
[9] උදාහරණයක් ලෙස Michael Fakhri, 'Rethinking the Right to Food' (Legal Form, 5 September 2018) බලන්න.
[10] Karl Marx, The Eighteenth Brumaire of Louis Bonaparte (1852) බලන්න.

කාලය හා අවකාශය හරහා ගමන් කරන ලද කොන්දේසි වලට යටත් වූ ඒකාබද්ධ කිරීම්, සහ ජාත්‍යන්තරයේ සිට ජාතික හා දේශීය දක්වා; පොදු සිට පෞද්ගලික දක්වා; දෘෂ්ටිවාදාත්මක සිට භෞතික දේ දක්වා; මිනිසාගේ සිට මිනිසා නොවන සහ ඉන් ඔබ්බට පවත්නා බොහෝ පරිමාණයන් සහ පාලන ස්ථානයන් වැනි දේ වලිනි. මෙවැනි සීමාකාරී සහ අනර්ථකාරී ක්‍රමවේදයන් දිනපතා ම අපගේ වටපිටාවන් - හා අපව ද - සකසමින් නැවත සකසමින් පැවත යයි.[11]

### 3. දකුණ ගමන් කරමින් පවතී

අධිරාජ්‍යය ගමන් කරමින් පවතින්නේ නම්, දකුණ ද ගමන් කරමින් පවතී. TWAIL කෘතීන් හි දකුණ සහ උතුර යන වර්ග කිරීම් භාවිතා කරන්නේ වෙනස් කොට දැක්වීම සඳහා භාවිතා කල හැකි දෘඩ සලකුණු හැටියට නොව. මෙම වර්ග කිරීම් භාවිතා කරනු ලබන්නේ ගෝලීය ආර්ථික, දේශපාලන හා නීති සබඳතාවල පරිණාමය සහ අඛණ්ඩතාවය මෙන් ම ඒවායේ අසන්තතාවයන් (evolution, continuities, and discontinuities) විශ්ලේෂණය කිරීම සඳහාය. මේවාට, අන්තර්ජාතික සංක්‍රමණයන්ට බලපානා හේතූන් සහ ඒවායේ බලපෑම්, රක්ෂණ ස්ථානයන් ඉල්ලුම් කිරීමේ රටාවන් (asylum patterns), ස්වදේශීය ස්වයිරීභාවය සම්බන්ධයෙන් ලොව පුරා පවත්නා ප්‍රශ්න; ජාත්‍යාන්තර මූල්‍ය අරමුදලේ, ලෝක බැංකුවේ, සහ එකිනෙකට සම්පූර්ණයෙන් ම වෙනස් රටවල් වන ග්‍රීසිය සහ ඉන්දුනීසියා වැනි රටවල් තුල සහ එවැනි රටවල් අතර ඇති දරිද්‍රතාවය සහ අසමානතාවය සම්බන්ධයෙන් කටයුතු කරන වෙනත් බලගතු අන්තර්ජාතික ආයතනයන්හි බලපෑම යන දේවල් ද අයත්වේ.[12]

TWAIL දිශානුගත කාර්යයන්හීදී ගෝලීය දකුණ සහ උතුර යන ද්වෛර්ගය ස්ථිර යථාර්ථයන් ලෙස නොව දේශීය විශේෂිතතා, කලාපීය ප්‍රවනතාවයන්, සහ ගෝලීය ආර්ථික හා දේශපාලන පද්ධතියේ විශාල වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් යෙදිය යුතු හා ප්‍රතිනිර්මාණය කළ යුතු ගතික රාමුවක් ලෙස අවබෝධ කරගත යුතු වේ. රාජ්‍යයන් සහ කලාපයන් අතර සහ තුල පවත්නා අසමානතාවයන් තවදුරටත් ගැඹුරු වෙමින් පවතින කාල පරිච්ඡේදයකට අප මුහුණ දෙමින් සිටින බැවින් වෙන කවර කාලයකටත් වඩා වර්තමානයේදී මෙය වැදගත්වේ. මෙම අසමානතාවයන්ගෙන් පරස්පරවිරෝධී ලෙස අවධාරණය වන්නේ අපගේ මෙම මානවකේන්ද්‍රී ලොව තුල වසන වැසියන් ලෙස අප දැරිය යුතු අන්තර් සම්බන්ධිත වගකීම්ය. එම නිසා TWAILහි හදවත රඳා පවතින්නේ කොතැනක ද යන්න පිළිබඳව 'ලෝකයේ වැඩි කොටස' යන වාක්‍ය ඛණ්ඩය මඟින් හොඳ විස්තරයක් ගම්‍ය කරනු ලබයි.

එසේ බැලූ කල TWAIL කෘතීන් පුරෝගාමී වී ඇත්තේ අන්තර්ජාතික නීතියේ පවත්නා යටත්විජිතවාදී ලක්ෂණ විදහා දැක්වීමේදී පමණක් නොවේ. පසුගිය දශක දෙක පුරාවට

---

[11] මා විසින් රචිත ලිපි ලේඛන තුලින් ද අන්තර්ජාතික නීතිය සහ අධිරාජ්‍යවාදයේ පුළුල් ක්‍රියාකාරීබවෙහි ඇති ගතිකත්වය දැක්වීමට මම උත්සාහ දරා ඇත්තෙමි. උදාහරණ ලෙස Luis Eslava, 'Istanbul Vignettes: Observing the Everyday Operation of International Law' (2014) 2(1) London Review of International Law 3; 'The Moving Location of Empire: Indirect Rule, International Law, and the Bantu Educational Kinema Experiment' (2018) 31 Leiden Journal of International Law 539 බලන්න.

[12] ගෝලීය දකුණ සහ උතුර සම්බන්ධයෙන් වන ගතික වැටහීම මත පදනම්ව ලියවෙන TWAIL සම්බන්ධ කෘතීන් / ලිපි ගැන විශේෂයෙන් ම මෑතකදී ලියවුනු මෙම ලිපි බලන්නඃ John Linarelli, Margot E. Salomon, and Muthucumaraswamy Sornarajah, The Misery of International Law: Confrontations with Injustice in the Global Economy (OUP, 2018).

ම TWAIL විද්වතුන් තර්ක කර දක්වා ඇත්තේ නවලිබරල්වාදයේ බලපෑම් නිශේද කිරීම සම්බන්ධයෙන් මානව හිමිකම් වලට ඇත්තේ ඉතාමත් ම සීමිත හැකියාවක් බවයි.[13] ඔවුන් විසින් තවදුරටත් තර්ක කර ඇත්තේ චිරස්ථාපිත ප්‍රතිපත්තීන් (orthodox principles) සහ ආයෝජන රාමු, ව්‍යුහාත්මක අගතිගාමීන්ගෙන් යුක්ත බවයි. සැමවිට ම ගෝලීය කේන්ද්‍රයකින් ලියවී ඇති TWAIL කෘතීන් දැන් අනාගතය හෙළි කරනා ලිපි බවට පත්ව ඇත්තේ ඒවායේ දක්වා ඇති කරුණු ම දැන් දැන් උතුරු ස්ථාන වලින් පැන නඟින අතර ම මුඛ්‍ය ධාරාවේ ශාස්ත්‍රීය කෘතීන් / ලිපි වලින් ද TWAIL වලින් එළැඹුණු නිගමන වලට [සමාන නිගමනයන්ට] එළෙඹෙමින් ඇති බැවිනි.

## 4. මෙම අරගලය බහුවිධ වේ

යටත්විජිතවාදය යනු අතීතයට අයත් දෙයක් නොවේ නම් සහ, දකුණ ගමන් කරන ලෙස ම අධිරාජ්‍යය ද ගමන් කරමින් පවතී නම්, ඉන් ගම්‍ය වන්නේ TWAIL අරගල කරනු ලබන්නේ පෙරමුණු බොහොමයක යන බව සහ එම අරගලය සිදු වන්නේ විවිධත්වයෙන් යුත් සහ විතැන් වන භූමියක් මත බවයි.

ඉතාමත් ම සාමාන්‍ය මට්ටමකින් ගත් කල TWAIL හි අරගලය වී ඇත්තේ අන්තර්ජාතික නීතිය සහ යටත්විජිතවාදය අතර අතීතයේදී පැවතුනු සහ වර්තමානයේදී පවතින සම්බන්ධතාවයට අදාළ ඓතිහාසික සටහන ප්‍රකට කර දැක්වීමයි. වඩාත් නිශ්චිත මට්ටමකින් TWAILදෙස බැලූ කල පෙනෙන්නේ අන්තර්ජාතික නීති ක්‍රමයට යටත්විජිතවාදය ප්‍රධාන සාධකයක් ලෙස ඇතුළත්වූ අවස්ථාවන් හඳුනා ගැනීම සහ අධිරාජ්‍යවාදයට උපකාර සපයන ධරය බවට අන්තර්ජාතික නීතිය පත්වූ ස්ථාන හඳුනා ගැනීම TWAILහි කාර්යයන් වන බවයි. මේවා එක්කොට ගත කල TWAILහි න්‍යාය පත්‍රය යොමුව ඇත්තේ නෛතික සම්මතයන් පරීක්ෂා කිරීම සහ ඒවා වෙනස් කිරීමටත්, සහ නීතිය වඩාත් ප්‍රගතිශීලී ලෙස නැවත මෙහෙයවීමකට ලක් කිරීමටත් ය. මෙයින් අදහස් වන්නේ නීතිය ප්‍රගතිශීලී දේශපාලනික සහ ආර්ථිකමය පරිචයන්ට සහ වපසරියන්ට අවධානය යොමු කරමින් ක්‍රියාත්මක විය යුතු බවයි. බුද්ධිමය ව්‍යාපෘතියක් ලෙස ගත්කල, TWAIL විද්වත් නවෝත්පාදනයන් ගැන සැලකිලිමත් වන අතර ම, TWAIL විද්වතුන් සහ අනෙකුන් විසින් රචිත විද්වත් කෘතීන්/ලිපි නිසි පිළිගැනීමකට ලක් කිරීම ගැන ද සැලකිලිමත් වේ.

## 5. අරගලය ඇත්තේ මෙතැනය

TWAIL හි පුළුල් පර්යේෂණ සහ දේශපාලනික ක්‍රියාවන් ඔස්සේ බැලූ කල, ස්ත්‍රීවාදී විද්වතුන් අපට පෙන්වා ඇති පරිදි ම, TWAILකරුවන් විසින්ද අවධාරණය කරනු ලබන්නේ පෞද්ගලික සහ දේශපාලනික යන දෙපැතිකඩයන්ට ම අවධානය යොමු කිරීමේ වැදගත් කමයි. මෙය තීරණාත්මක කරුණක් වන්නේ ගෝලීය දකුණේ රාජ්‍යයන් සහ පුරවැසියන් අත්විඳිනා වේදනාකාරී තත්ත්වයන් හේතුවෙනි. යටත්විජිතවාදයේ පීඩාකාරී සහ විජාතික හීතිකා වලින් ගැලවීමෙන් පසුව පශ්චාත් යටත්විජිතභාවයේ

[13] මානව අයිතිවාසිකම් පිළිබඳව විවේචනාත්මක පැතිකඩකින් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ලියැවුණු Upendra Baxi, The Future of Human Rights (OUP, 2002) බලන්න. මානව අයිතිවාසිකම් සම්බන්ධව පවත්නා විවාද වලට TWAIL දායක වූ අවස්ථාවක උදාහරණයක් ලෙස Ratna Kapur, Gender, Alterity and Human Rights: Freedom in a Fishbowl (Edward Elgar, 2018) බලන්න.

ස්වාධීන ජීවිත පිළිබඳව මෙවැනි සමාජ වල සංඥා ඇතිව තිබුන ද, එම සංඥා ම, පසුව, තමන් පෙරදී පලා යාමට උත්සාහ ගත් පීඩාකාරී සහ විජාතික භීතිකා තත්ත්වයන් බවට තම රටවල් තුලදී ම පරිවර්තනය වී තිබිය හැක. තෙවන ලෝකයේ බොහෝ රටවල් වල, තවදුරටත් යටත්විජිතවාදයේ උරුමය ක්‍රියාකාරී ලෙස ද අක්‍රිය ලෙස ද ක්‍රියාත්මක වෙමින් පවතියි. එසේ වී ඇත්තේ එම රටවල් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් විනාශකාරී නිෂ්පාදන හා පරිභෝජනයේ චක්‍ර වල සිරවී ඇති නිසාත්; ඔවුන් අන්තගාමී ලෙස සාමාන්‍ය ජන ජීවිතය ආරක්ෂණවාදයට (securitisation) ලක් කර ඇති නිසාත්; තවමත් යටත්විජිතවාදයට ලක්වෙමින් සිටිනා ස්වදේශීය කණ්ඩායම් සහ සුළු ජනකොටස්වල විරෝධාකල්ප වලට කන් නොයොමා සිටීම නිසාත්ය.[14] එම නිසා TWAIL විද්වතුන්ට අරගලය සැමවිට ම එතැන මෙන්ම මෙතැන ද පවතියි. එය ඉදිරියට ද එසේ විය යුතුය. දැනට සහ ඉදිරියට TWAIL වත්මන් 'උපක්‍රම' ගැන මෙන් ම දිගු 'උපාය මාර්ගයක්' ගැන ද සැලකිල්ල යොමු කල යුතුය.[15]

මෙම ලිපිය අවසන් කිරීම සඳහා මම වැකි දෙකක් යොදා ගනිමි. TWAIL යනු ව්‍යාපාරයක් මිස ගුරුකුලයක් නොවේ; ජාලයක් මිස ආයතනයක් නොවේ; සංවේදීතාවයක් මිස මූලධර්මයක් නොවේ. සියල්ලටත් වඩා, මෙම අවිවේකීභාවය සහ විවෘතභාවය සඳහා වූ කැපවීම පෝෂණය කරනු ලබන්නේ, TWAIL ප්‍රතිචාර දක්වන සහ එහි ගම්‍යතාව පැනනගින ලෝකයේ විවිධත්වය නිසාමය.

----------------------------------------------

*කතුවරයාගේ පිළිදැනුම: ජෙනිෆ එවන්ස් ගේ සංස්කරණ සහයට මම ස්තුතිවන්ත වන අතර, මෙම බ්ලොග් පොස්ටුවේ මුල් පිටපත් සමීප ලෙස කියවා අදහස් දැක්වීම සම්බන්ධයෙන් ඇන්තනී ඇන්ගී, රොබ් නොක්ස්, වාසුකී නේසයියා, සන්ධ්‍යා පහුජා, රෝස් පා(ර්)ෆිට්, සහ ජෝන් රෙනෝල්ඩ්ස්ට ස්තුතිවන්ත වෙමි. 'International Law under Construction' යන බ්ලොග් වෙබ් අඩවියට මම ස්තුතිය පුදකරන්නේ TWAILසම්බන්ධයෙන් වන මෙම දළ විශ්ලේෂණය ලිවීමට අරාධනා කිරීම සඳහා සහ පසුව එය 'Critical Legal Thinking' හි නැවත පලකිරීමට අවසර ලබාදීම සම්බන්ධයෙනි.*

*ලුවීස් එස්ලාවා කෙන්ට් විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වන අතර එහි 'Centre for Critical International Law' (CeCIL) යන මධ්‍යස්ථානයේ සම අධ්‍යක්ෂක තනතුර ද හොබවයි.*

----------------------------------------------

This was translated into Sinhala by Danushka S. Medawatte. Danushka studied law at Faculty of Law, University of Colombo (Sri Lanka), and at Harvard Law

[14] උදාහරණයක් ලෙස Mohammad Shahabuddin, 'Postcolonial Boundaries, International Law, and the Making of the Rohingya Crisis in Myanmar' (2019) 9 Asian Journal of International Law; Luis Eslava, 'The Developmental State: Dependency and Independency and the History of the South' in Philipp Dann and Jochen von Bernstorff (eds), The Battle for International Law (forthcoming, 2019, OUP) බලන්න.

[15] Robert Knox, 'Strategy and Tactics' (2010) 21 Finnish Yearbook of International Law 1 බලන්න.

School (USA). She is a Senior Lecturer in law at University of Colombo. She is currently reading for her PhD in law at Kent University (UK).

මෙය සිංහලට අනුවාදනය කරනු ලැබුවේ ධනුෂ්කා එස්. මැදවත්ත විසිනි. ධනුෂ්කා නීතිය හදාරන ලද්දේ (ශ්‍රී ලංකාවේ) කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ සහ (ඇමරිකා එක්සත් ජනපදයේ) හාවඩ් විශ්වවිද්‍යාලයෙනි. ඇය, කොළඹ විශ්වවිද්‍යාලයේ, නීතිය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකි. වර්තමානයේදී ඇය (එක්සත් රාජධානියේ) කෙන්ට් විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳව ආචාර්ය උපාධිය හදාරමින් සිටියි.

-----------------------------------------------